www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අවධමනය ගැඹුරු වෙද්දී එක්සත් ජනපදයේ ෆෙඩරල් මහ බැංකුව පොලී අනුපාතික කපා හරියි

## US Federal Reserve cuts interest rates as recession deepens

**පැට්‍රික් ඕ කොනර් විසිනි**
**2008 ඔක්තෝබර් 30**

ඊයේ දිනයේ මහ බැංකුව ෆෙඩරල් අරමුදලේ පාදක පොලී අනුපාතිකය සියයට 1 දක්වා සියයට .5 කින් කපා හලේය. ඒ අනුව මෙම මාසයේ දෙවන වතාවට කල පොලී අනුපාතය පහත හෙලීම මගින් 2003 හා 2004 ප්‍රථම වතාවට වාර්තා ගත වූ පහලම මට්ටමට නිල අනුපාතය ගෙනැවිත් තිබේ.

කැලඹිලි සහිත එක්සත් ජනපද කොටස් වෙලඳපොල අනුපාතයන් කපාහැරීමක් අපේක්ෂාවෙන් හිස එසවූ අතර ඩව් ජෝන්ස් දර්ශකය සියයට 10.9 ක නැගීමක් 28 වන දින වාර්තා කලාය. එහෙත් ඊට පසු දින සවස ගනුදෙනු අවසානයේ යලිත් සියයට 0.82 කින් පහත වැටුනි.

පසුගිය දින දෙකෙහි පලවූ නව දත්ත වලින් එක්සත් ජනපද ආර්ථිකය උග්‍රාවධමනයකට පිවිසි ඇති බවට තවදුරටත් කරුනු අනාවරනය වෙයි.

සමුලු මන්ඩලය 28 වන දින නිකුත් කල සංඛ්‍යාවන්ට අනුව 1967 දත්ත රැස්කිරීමට පටන් ගැනීමෙන් පසුව පාරිභෝගික විශ්වාසය පිලිබඳ දර්ශකය එහි පහලම මට්ටම වන 38.0 කඩා වැටුනි. සැප්තැම්බරයේදී දර්ශකය පැවතුනේ 67.4 මට්ටමේය. මෙම වැටීම විශ්ලේෂකයන් අපේක්ෂා කලාට වඩා සැලකිය යුතු තරමකින් ඉහල මට්ටමකි. අර්ඩීකිව් ආර්ථික ආයතනයේ ජෝන් රයිඩිං ඔක්තෝබර් සංඛ්‍යා ගැන සඳහන් කලේ '' තිගැස්මක් ඇති කරන තරම් දුබල තොරතුරු'' බවටය.

එදිනම නිකුත් වූ නිවාස මිල ගනන් පිලිබඳ එස් අන්ඩ් පී කේස්-ෂිලර් දර්ශකයට අනුව අගෝස්තු මාසයේ නිවාස මිල ගනන් 2007 වසරේ එම කාලය හා සසඳන කල සමීක්ෂනය කරන ලද නාගරිකයන් 20 ක නිවාස මිල ගනන් සියයට 16.6 කින් පහත වැටී ඇත. ලාස් වේගාස්, මියාමි, ෆීනික්ස් හා සැන් ෆ්‍රැන්සිස්කෝ හි සියයට 25-30 අතර වැඩිම කඩාවැටීම වාර්තා විය. ගෝල්ඩ්මන් සැක්ස්හි අර්ථ ශාස්ත්‍රඥයා අනාවැකි පල කලේ නිවාස මිල ගනන් ජාතික වශයෙන් තවත් සියයට 15 කින් වැටෙනු ඇති බවටය.

ඊයේ දිනයෙහි *වෝල් ස්ට්‍රීට් ජර්නලයේ* වාර්තාවක සඳහන් වූයේ ''වර්තමාන යටි නැඹුරුව 1990-91, 2001 අවධමනයන්ට ද, 1982 න් අවසන්වූ දිග්ගැස්සුනු පහත වැටීමට ද වඩා නරක හැඩයක් ගනිමින් තිබෙන බවත්, බැංකු නය දීම් කපා හරිමින් ද, පාරිභෝගිකයන් අඩුවෙන් වියදම් කරමින් ද, ලාභ හැකිලීම මධ්‍යයේ සමාගම් රැකියා කප්පාදු කරමින් ද, නිවාස වටිනාකම් එක දිගට පහතට රූටා යාමෙන් බිඳ වැටෙමින් ද එය පෙන්නුම් කරන'' බවයි.

*නිව් යෝර්ක් ටයිම්ස්* මාධ්‍ය ජාලයට අනුව පුලුල් ජන කොටස් වර්ධනය වන සමාජ ආපදාවන්ට මුහුනපා ඇති ආකාරය පෙන්නුම් කරන එක් දර්ශකයක් නම් ක්‍රෙඩිට් කාඩ් නය පැහැර හැරීමයි. මෙම වසරේ මුල් මාස හය ඇතුලත පැහැර හැර ඇති ක්‍රෙඩිට් කාඩ් නය ඩොලර් බිලියන 21 ක් බැංකු විසින් කපා හැර ඇති බව වාර්තාවේ. විශ්ලේෂකයන් සඳහන් කරන්නේ ඉදිරි 18 මාසය තුල තවත් බිලියන 55 ක් අහිමිවනු ඇති බවය.

ක්‍රෙඩිට් කාඩ් සමාගම් මීට ප්‍රතිචාර දක්වා ඇත්තේ අවධමනයෙන් විපතට පත්වූවන් ඉලක්ක කර ගනිමින්ය. *ටයිම්ස්* වාර්තා කලේ ''නය හිමියන් දැනටමත් නයවී ඇති පාරිභෝගිකයන් මඟ හරිමින් ද, අනෙකුත් කාඩ් පත් හිමියන්ගේ විශේෂයෙන්ම නිවාස අර්බුදයෙන් වියසනයට පත්ව ඇති ප්‍රදේශ වල වාසය කරන හෝ ගැටලු සහගත කර්මාන්තයන් හි රැකියාවල නියුතු අයගේ නය සීමාවන් කපා හරිමන් ද සිටියි. සමහර අවස්ථාවල අවදානම් සහගත නය කරුවන් බඩු මිලට ගන්නා වෙලඳසැල් වලින් ගනු දෙනු කරන හෝ සැකයට පාත්‍රව ඇති සමාගම් වලින් උකස් නය ලබාගෙන ඇති කාඩ් පත් හිමියන් නිරීක්ෂනය කිරීමෙන් පසුව නය පහසුකම් අත්හිටුවීමට පවා නය හිමියන් කටයුතු කරමින් සිටියි.''

තොග පිටින් දොට්ට දැමීම් දිනපතා නිවේදනය කෙරෙයි. 2009 අවසන්වන විට තමන් කලින් නිවේදනය කල දොට්ට දැමීම් සංඛ්‍යාව 2000 සිට 5000 දක්වා වැඩිකරන බව ගෘහ උපකරන නිෂ්පාදන සමාගමක් වන වර්ල්පූල් සමාගම ඊයේ නිවේදනය

කලේය. සමාගමේ මුලු ශ්‍රම බලකායෙන් සියයට 7 කට බලපාන මෙම නෙරපාහැරීම් සිදුවන්නේ පාරිභෝගිකයන් අබලන්වූ උපකරන සඳහා අලුතින් මිලට ගැනිම් ප්‍රමාද කිරීමේ හේතුව මතය. වර්ල්පූල් තෙවෙනි කාර්තුව තුල නිෂ්පාදනය සියයට 10 කින් කපා හැරිය අතර කම්හල් වසාදැමීම මගින් මෙම වසරේ අවසන් කාර්තුවෙහි එක්සත් ජනපදය හා යුරෝපය තුල නිමැවුම තවත් සියයට 20 කින් අඩු කරනු ඇත.

මෑතකදී නිවේදනය කල රැකියා කප්පාදුවට පහත සඳහන් තොරතුරු ද ඇතුලත්ය. ක්වෙස්ට් කොමියුනිකේෂන් යන දුරකථන සමාගම රැකියා 1200 ක් ද, ටයිම් ප්‍රකාශන සමාගම ශ්‍රම බලකායෙන් සියයට 6 ක් ද, කපාහැරීමට සැලසුම් කර ඇත. ඩබල්ඩේ ප්‍රකාශකයෝ සේවක මන්ඩලයෙන් සියයට 10 ක් රැකියා වලින් ඉවත් කර ඇත. ගැනට් ප්‍රවෘති ප්‍රකාශකයන් දැනට ඉවත් කර ඇති සියයට 3 ට අමතරව තවත් සියයට 10 ක් දෙනා ඉවත්කරනු ඇත.

දැඩි ලෙස ප්‍රහාරයට ලක්ව ඇති අය අතර මෝටර් රථ ආශ්‍රිත කරමාන්තයන්හි නිරත කම්කරුවන් ප්‍රධානය. මෝටර් රථ නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන්ගේ පහත් ඉල්ලුම නිසා මිචෙලින් හි ගුඩ්රිච් කර්මාන්තයේ ඉන්ඩියානාහි වුඩ් බර්න් ටයර් කම්හලේ ශ්‍රම බලකායෙන් සියයට 40 ක් අවම වශයෙන් සති අටකට වත් රැකියාවලින් ඉවත් කරන බව නිවේදනය කර තිබේ. ඇලබාමාහි අනෙකුත් ගුඩ්රිච් කම්හල් තුනෙහි කම්කරුවන් 1500 කට බලපාන පරිදි රැකියා කප්පාදුවක් සැලසුම් කර ඇත.

මෝටර් රථ උපාංග නිෂ්පාදක ටෙනකෝ ඊයේ නිවේදනය කලේ සිය කම්හල් 5 ක් වසාදමා 1100 ක් කම්කරුවන් ඉවත් කරන බවයි. ස්ථිර හා අනියම් කම්කරුවන් ඇතුලත් වන මෙම කම්හල් වැසීම ඇමරිකාවේ පමනක් නොව ඕස්ට්‍රේලියාවේ ද සිදුවෙයි. වාර්ෂික පදනමකට අනුව උතුරු ඇමරිකානු මෝටර් රථ අලෙවිය තෙවෙනි කාර්තුවෙහි සියයට 15.5 කින් වැටී ඇත. එම කාලය තුල ජෙනරල් මෝටර්ස්හි උතුරු ඇමරිකානු අලෙවිය සියයට 18.9 කින් ද ගෝලීයව සියයට 11.4 කින් ද වැටී ඇත. හිටපු කාර්මික යෝධයා සෑම මසකම මිලියන සිය ගනනින් අලාභ ලැබීමට පටන් ගෙන තිබේ. 28 වන දින මූඩීස් වර්ගීකරන ආයතනය ජීඑම් හි නය අනුපාතය ''සුන්බුන්'' තත්වයට පහත හෙලීය. සමාගම දැන් රැඳී ඇත්තේ යාහැකි පහලම මට්ටමට හිනිපෙත් තුනක් පමනක් ඉහලිනි.

ජෙනරල් මෝටර්ස් හා ක්‍රයිස්ලර් සමාගම් සිය ඒකාබද්ධවීමේ බාහිර ගැටලු විසඳ ගැනීමෙන් පසුව දැන් මහ ආන්ඩුවෙන් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන අපේක්ෂාවෙන් සිටියි. ජීඑම් හි ප්‍රධාන විධායක රික් වැගොනර්, මූල්‍ය ක්ෂේත්‍රයට බුෂ් පරිපාලනයේ ඇපදීමේ සැලසුමට අනුව මහජන අරමුදල් කඩාගැනීම සඳහා වොෂිංටනයේ නිලධාරීන් හමුවී බලපෑම් කලේය.

රොයිටර් වෙත ලැබුනු තොරතුරු අනුව එය වාර්තා කලේ ජීඑම් ඩොලර් බිලියන 10 ක් බලාපොරොත්තු වන අතර භාන්ඩාගාර දෙපාර්තමේන්තුව බිලියන 5 ක් දීමට සලකා බලමින් සිටින බවය. වාර්තාවට අනුව ඇපදීමට '' ආන්ඩුව මගින් ප්‍රාග්ධන එන්නත්කිරීම මෙන්ම අවදානම් මෝටර් රථ නය මිලට ගැනීම ද ඇතුලත් වෙයි. *වෝල් ස්ට්‍රීට් ජර්නලය* 28 වන දින සඳහන් කලේ වඩාත් කාර්යක්ෂම වාහන නිපදවීම සඳහා වාහන කර්මාන්තයට පසුගිය මාසයේ අනුමත කල බිලියන 25 න් කොටසක්, බල ශක්ති දෙපාර්තමේන්තුව හරහා ලබාදෙනු ඇති බවයි.

ජීඑම් ක්‍රයිස්ලර් සමාගම් බද්ධ කිරීම සඳහා ආන්ඩුවේ මූල්‍යාධාර පිරිනැමීමේ මෙහෙයුම විනාශකාරී සමාජ ප්‍රතිපල ගෙන එනු ඇත. සිය සමාගම් බිමට සමතලා කිරීමට වගකිවයුතු ඉහල විධායකයන් එක්කෝ තම ලාභදායී වැටුප් පොදි රැකගැනීම හෝ විශ්‍රාම ගැනීමේදී මිලියන ගනන් සන්තෝෂම් හිමිකර ගැනීම නිසැකය. අනෙක් අතට කම්කරුවන්ගෙන් තවත් විශාල කැපකිරීම් කරන ලෙස ද සිය ජීවන තත්වයන්ට වැටුප් වලට හා රැකියාවලට එල්ලවන ප්‍රහාරයන් දරාගන්නා ලෙස ද ඉල්ලා සිටිනු ඇත.

ඊයේ *ගාඩියන්* පුවත් පතෙහි පලවූ ලිපියකින් එක්සත් ජනපද මෝටර් රථ යෝධයන්ගේ බද්ධවීමෙහි ශක්‍ය බලපෑම පිලිබඳ යම් ඇඟවුමක් කරයි. ''නිෂ්පාදකයන් 355000 ක් මිනිසුන්ට සෘජු රැකියා සපයන අතර වානේ හා ප්ලාස්ටික් නිමැවුම් දක්වා වන අංශවල හා ඉලෙක්ට්‍රොනික හා පරිගනක චිප් කර්මාන්තය තුල තවත් මිලියන 4.5 කට ද රැකියා සපයයි. මිචිගන් හි ලාභ නො උපයන රථවාහන පරියේෂන මධ්‍යස්ථානයේ ගනන් බැලීම් වලට අනුව ෆෝර්ඩ් හෝ ජීඑම්හි අසාර්ථකත්වයක් දල දේශීය නිෂ්පාදනයෙන් සියයට 2 කට වග කියනු ඇති අතර මිලියන දෙකකගේ රැකියාවන් විනාශ කරනු ඇත.''

ආර්ථික අර්බුදය ක්ෂේත්‍ර ගනනාවක් පුරා බද්ධවීම් පිලිබඳ යෝජනා පෙරට ගෙනවිත් තිබේ. ලෝකයේ විශාලතම ගුවන් සමාගම බිහිකිරීමට තුඩුදෙන ඩෙල්ටා එයාලයින්ස් හා නෝර්ත්වෙස්ට් යන ගුවන් සමාගම් දෙකේ සැලසුම් ගත ඒකාබද්ධය සඳහා අධිකරන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබේ. මෙහි ප්‍රතිපලයක් ලෙස තවත් රැකියා දහස් ගනනක් අහෝසිවනු ඇත.

ආර්ථික පල්ලම් බැසීමේ වේගය අර්ශාස්ත්‍රඥයන් ගනනාවකගේ ඇස් ඇරවා තිබෙන අතර ඔවුන් දැන් අවධමනාත්මක අර්බුදයක හැකියාව පිලිබඳව අනතුරු

අඟවමින් සිටිති. *වෝල් ස්ට්‍රීට් ජර්නලය* හිටපු ෆෙඩරල් මහ බැංකු අධිපති ලෝරන්ස් මයර්ගේ ප්‍රකාශයන් උපුටා දක්වයි. ''විරැකියා අනුපාතයේ අපේක්ෂිත වැඩිවීම සමඟ වැඩෙන අවධමනයේ තර්ජනය ෆෙඩරල් මහ බැංකු අරමුදල් අනුපාතිකය තවදුරටත්, සමහරවිට ශුන්‍යය කරාම පහත හෙලීමේ අවදානම මතු කරයි.''

ඊයේ *ෆිනෑන්ෂල් ටයිම්ස්* හි ජ්‍යෙෂ්ඨ තීරු රචක මාටින් වුල්ෆ් මෙසේ ලිවීය. ''ක්ෂනික පහත වැටීමක් අතීතයේදී ලෝකය අත්කරගෙන ඇති අතිරික්තයන් අතුගා දමනු ඇතැයි යන අදහස හාස්‍යජනකය. ඒ වෙනුවට අන්තරාය වන්නේ එක්සත් ජනපදය තුල නම් එහි දල දේශීය නිෂ්පාදිතය මෙන් තුන් ගුනයකට සමාන වන පෞද්ගලික නය කන්දෙහි ගිලාබැසීම මහා බංකොලොත් භාවයක් තුලට ඇද වැටීමයි. භූගෝලීය කරනය සෑම තැනකම විනාශය පතුරුවා හැර තිබේ. ගොදුරු බවට පත්වන බොහෝ දෙනෙක් අහිංසක ලෙස අතීත අතිරික්තයන් හිමිකරගෙන ඇති අයයි. මේ අතර වඩාත්ම වැරදි කර ඇති බොහොමයක් සිය අශික්ෂිත ජයග්‍රහන රැකගනු ඇත. මෙය 19 වන සියවසේ රාජ්‍ය නිර්බාධවාදය යලි පුනර්ජීවනය සඳහාවූ වට්ටෝරුවක් නොව විදේශික භීතිකාව, ජාතිකවාදය හා විප්ලවය සඳහා වට්ටෝරුවකි.''

මෙම අත්‍යසාමාන්‍ය ප්‍රකාශනය සලකුනු කරන්නේ දිග්ගැස්සෙන ලෝක ආර්ථික අර්බුදයක් ප්‍රධාන සමාජ හා දේශපාලන පිපිරීමක කොකා ගැස්සීමේ හැකියාව පිලිබඳව පාලක පැලැන්තිය කොතෙක් සංවේදී ද යන්නයි.

© www.wsws.org